**පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය - (පුරනැගුම) 2017**

**------------------------------------------------------------------------**

පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියේ (පුරනැගුම) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 ඔක්තෝබර් 21 දින එළඹි අංක 2790 - එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.02 වගන්තිය සහ 2016 නොවැම්බර් 02 දින එලඹි අංක 3431 -එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය, වර්තමානයේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් 07හි පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ, ගිණුම් කටයුතුභාවය හා මූල්‍යමය හා තාක්ෂණිකව ශක්තිමත් වූ පළාත් පාලන ආයතන මඟින් දියුණු පළාත් පාලන යටිතල පහසුකම් හා කාර්යක්ෂම සේවා සැපයීමක් ඉටුකර ගැනීමයි. ව්‍යාපෘතියේ පසු ණය මුදලෙහි අරමුණු වනුයේ දැඩි ලෙස වකුගඩු රෝගයෙන් බලපෑමට ලක් වූ ශ්‍රී ලංකාවේ පළාත් 07 හි අඩු දියුණු ප්‍රදේශවල පළාත් පාලන ආයතන හා ජාතික ජල සම්පාදන හා ජලා පවහන මණ්ඩලයේ යටිතල පහසුකම් හා සපයන සේවා දියුණු කිරීම වේ. එම නිසා, ජල සැපයුම් පද්ධති, යටිතල පහසුකම්, මූලික සේවා සැපයීම් පිළිබඳ පළාත් පාලන ප්‍රතිපත්තිය ප්‍රතිසංස්කරණය සහ ධාරිතා වර්ධනය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් පවතින ගැටළු පිළිබඳව අවධානය යොමු කිරීම අරමුණු වේ. මුල් ණය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 8,940 කට සමාන එජඩො මිලියන 68.8 ක් වූ අතර එයින් රු.මිලියන 7,670 කට සමාන එජඩො මිලියන 59 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. කෙසේ වුවද, විදේශ ගැනුම් හිමිකම්වලට එරෙහිව එජඩො ප්‍රතිප්‍රමාණය වීම හේතුවෙන්, ණය නියෝජිතායතනය එකඟ වන ලද මුදල රු.මිලියන 7,892 කට සමාන එජඩො මිලියන 52.04 ක් ලෙස පසුව තීරණය වී තිබුණි. තවද, පසු ණය ගිවිසුම මඟින් ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 67.84 ලෙස තීරණය වූ අතර එයින් රු.මිලියන 8,700 කට සමාන එජඩො මිලියන 60 ( විගැහි මිලියන 43.30) ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යානය කිරීමට එකඟවී තිබුණි. 2012 ජුලි 01 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2015 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2017 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි. තවද, පසු ණය ගිවිසුම යටතේ ව්‍යාපෘතියේ කටයුතු 2020 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ

හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(උ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(එ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඔ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

-------

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ එම ගිණුමින් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

--------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂයේ අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුල හා 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාළ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම් වලට අනුව මුල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුල | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| -------- | ------------------ | | ------------------------- | ---------------------- | | ---------------------- | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ | | | | | | | |
| - 2790 | 59.00 | 7,670.00 | 1,050.00 | 6.89 | 1,048.75 | 51.27 | 7,221.13 |
| - 3431 | 60.00 | 8,700.00 | 500.00 | 2.31 | 354.45 | 2.31 | 354.45 |
| ශ්‍රීලංර | 17.57 | 2,401.10 | 342.00 | 2.07 | 314.98 | 10.03 | 1,417.90 |
| | -------- | ------------ | --------- | -------- | ----------- | --------- | ----------- |
| එකතුව | **136.57** | **18,771.10** | **1,892.00** | **11.27** | **1,718.18** | **63.61** | **8,993.48** |

**3.2 භෞතික ප්‍රගතිය**

-------------------

ණය ගිවිසුම් අංක 2790 - එස්ආර්අයි(එස්එෆ්) යටතේ ව්‍යාපෘතියේ මූලික තාක්ෂණික සහායක වාර්තාවේ පොදු කොන්දේසිය අනුව, පරිපාලන ගොඩනැඟිලි ඉදිකිරීමට සහ යටිතල පහසුකම් සහ අනෙකුත් ප්‍රජා පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා තෝරාගනු ලැබූ පළාත් පාලන ආයතන වෙත එකකට රු.මිලියන 50 බැගින් වෙන් කිරීමට ව්‍යාපෘතිය එකඟ වී තිබුණි. ප්‍රගති වාර්තා වලට අනුව, පළාත් පාලන ආයතන 161 ක පරිපාලන ගොඩනැඟිලි 40 ක් ඉදිකිරීම, යටිතල පහසුකම් 21 ක් වැඩිදියුණු කිරීම, ප්‍රජා පහසුකම් 89 ක් වැඩිදියුණු කිරීම, ජල සම්පාදන ව්‍යාපෘති 25 ක් වැඩි දියුණු කිරීම සහ වෙනත් සංවර්ධන කාර්යයන් 03 ක් යනාදි සංවර්ධන කාර්යයන් සිදුකිරීමට සැලසුම් කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින විට සම්පූර්ණ කර තිබුණි. කෙසේ වෙතත්, ණය ගිවිසුම් අංක 3431-එස්ආර්අයි(එෆ්එෆ්) යටතේ මුල්‍ය සම්පාදනය මත සිදුකිරීමට සැලසුම් කර ඇති ජල සම්පාදන ව්‍යාපෘති 64 කින් ජල සම්පාදන ව්‍යාපෘති 08 ක වැඩිදියුණු කිරීමේ කටයුතු වයඹ, උතුරු මැද, ඌව, මධ්‍යම පළාත් වල සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කර පමණක් තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොදු ලක්ෂණයක් වශයෙන්, අළුතින් ඉදිකරන ලද ගොඩනැගිලිවල සහ අනෙකුත් ආකෘතිවල තත්ත්වයේ අසමත්වීම් විගණන කාල පරිච්ඡේදය තුළදී විගණකයන් විසින් සිදුකරන ලද ස්ථානීය පරික්ෂණ වලදී අනාවරණය විය. දකුණු පළාතේ සූරියවැව ප්‍රාදේශීය සභාවේ මත්ස්‍ය වෙළඳ පරිශ්‍රයේ රු.මිලියන 44.93 ක මුළු පිරිවැයකට ඉදිකරන ලද මායිම් බිත්තියේ ස්ථාන 40 ක පිපිරීම් දක්නට ලැබුණි. තවද, දකුණු පළාතේ කරන්දෙනිය, තිස්සමහාරාම සහ කටුවන ප්‍රාදේශීය සභා සහ මධ්‍යම පළාතේ මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා විසින් ඉදිකරන ලද ගොඩනැඟිලි සහ අනෙකුත් ආකෘතිවල දෝෂ පෙර වර්ෂයේ මාගේ වාර්තාවේ පෙන්වාදී තිබුණි. එමගින් පළාත් පාලන ආයතන කිහිපයක් විසින් ක්‍රියාත්මක කරන ලද සිවිල් ඉදිකිරීම් වැඩ විධිමත් ක්‍රමවේදයකට අධීක්ෂණය කර නොතිබුණු බව සාක්ෂි වේ.

(ආ) ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 53.18 කට 2017 අගෝස්තු 18 දින ප්‍රදානය කරන ලද දකුණු පළාතේ හබරාදුව ප්‍රාදේශීය සභාවේ පුස්තකාලය සහ ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ වැඩ 2017 දෙසැම්බර් 31 දින වන විටත්

ආරම්භ කර නොතිබුණු බව නිරීක්ෂණය විය. ලැබී තිබුණු තොරතුරු අනුව, අදාල ගොඩනැගිල්ලේ අවශ්‍යතාවය නැවත සලකා බැලීමට සහ වැඩ ආරම්භ නොකිරීමට අවශ්‍ය පියවර ගැනීමට 2018 පෙබරවාරි 23 වන දින පැවති රැස්වීමේදී රේඛීය අමාත්‍යාංශයේ ලේකම් උපදෙස් ලබාදී තිබුණි. ඒ සඳහා 2017 දෙසැම්බර් 31 දින වන විට ප්‍රචාරණය සහ උපදේශක සේවා මත එකතුව රු.මිලියන 1.60 ක් වියදම් කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) බෙන්තොට ප්‍රාදේශීය සභාවේ සති පොළ සඳහා ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් ලංසු කැඳවීමට 2017 ජුනි 30 දින ප්‍රසම්පාදන දැන්වීම් පුවත්පත්වල පල කළද, ලංසු ලේඛනවල අඩුපාඩු නිරීක්ෂණය වීම හේතුවෙන්, 2017 දෙසැම්බර් 31 දින වන විටත් ලංසු ප්‍රදානය කර නොතිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ පැහැදිළි කිරීම් අනුව, ලංසු නැවත කැඳවීමට පියවර ගෙන තිබුණු අතර කොන්ත්‍රාත් 2018 මාර්තු දී ප්‍රදානය කර තිබුණි.

(ඇ) මධ්‍යම පළාතේ උඩ පළාත ප්‍රාදේශීය සභාවේ සහ උඩු දුම්බර ප්‍රාදේශීය සභාවේ සහ උතුරු මැද පළාතේ මිහින්තලේ ප්‍රාදේශීය සභාවේ සහ තමන්කඩුව ප්‍රාදේශීය සභාවේ ජල සම්පාදන ව්‍යාපෘති වල වැඩ රු.මිලියන 399.13 පිරිවැයකට 2017 ජුනි 30 දිනට සම්පූර්ණ කර තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුවන් විසින් ජල සම්පාදන ව්‍යාපෘති අදාල ප්‍රාදේශීය සභා වලට භාරදීමට 2018 මැයි 15 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

## 3.4 නිෂ්ක්‍රීය සහ ඌන උපයෝජිත වත්කම්

---------------------------------------------

කාර්යයන් සම්පූර්ණ කර පළාත් පාලන ආයතන වෙත භාරදී ඇති සිවිල් ඉදිකිරීම් කිහිපයක් පොදු මහජනතාවගේ අපේක්ෂිත අරමුණු සඳහා භාවිතයට අවසර ලබාදීමට අවශ්‍ය පියවර ගැනීමෙන් තොරව දීර්ඝ කාලයක් තිස්සේ නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. නිරීක්ෂණය වූ අවස්ථා පහත විස්තර කෙරේ.

(අ) මධ්‍යම පළාතේ නාවුල ප්‍රාදේශීය සභාව සඳහා රු.මිලියන 50.77 ක පිරිවැයකට ඉදිකරන ලද බහු කාර්ය ගොඩනැගිලි සහ රු.මිලියන 37.66 ක පිරිවැයකට උතුරු මැද පළාතේ ලංකාපුර ප්‍රාදේශීය සභාවේ සහ බුල්නෑව ප්‍රාදේශීය සභාවේ පොදු බස් නැවතුම්පොළ සහ සති පොළ සඳහා ඉදිකරන ලද අනෙකුත් ගොඩනැගිලි පොදු මහජනතාවගේ භාවිතය සඳහා අවසර දීමෙන් තොරව 2017 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 1 ½ ක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි.

(ආ) අඛණ්ඩ ජල සැපයුමක් සඳහා අවශ්‍ය මූලාශ්‍ර හිගකම හේතුවෙන්, රු.මිලියන 64.83 ක පිරිවැයකට සම්පූර්ණ කළ වනාතවිල්ලුව සභාවේ ජල සැපයුම් ව්‍යාපෘතිය 2017 ජුනි 30 භාරදුන් දින සිට නිෂ්ක්‍රීයව පවතී. තවද, බෙදාහැරීම් අරමුණින් අදාල ප්‍රාදේශීය සභා වලට ජල බවුසර් සපයා නොතිබීම හේතුවෙන් මහව සහ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අයත් ග්‍රාම නිලධාරී වසම් 14 කට බෙදාහරින ලද රු.මිලියන 58.32 කට මිලදී ගෙන තිබුණු ඒකක ධාරිතාවය ලීටර 5,000 සහිත ජල ටැංකි 60 ක් සහ ඒකක ධාරිතාවය ලීටර 2,000 සහිත ජල ටැංකි 74 ක් 2017 ජුනි 30 දින සිට නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) වයඹ පළාතේ රිදීගම සහ මාවතගම සහ දකුණු පළාතේ කඹුරුපිටිය ප්‍රදේශයේ රු.මිලියන 143.62 පිරිවැයකට ප්‍රතිසංස්කරණය කරන ලද පොදු බස් නැවතුම්පොළ පොදු මහජනතාවගේ භාවිතයට ඉඩදීමකින් තොරව 2017 දෙසැම්බර් 31 දින වන විට මාස 6 තිස්සේ නිෂ්කාර්ය පැවතුණි. තවද, නිසි ප්‍රවේශ මාර්ග නොමැති හේතුවෙන්, රු.මිලියන 36.29 ක පිරිවැයකට දකුණු පළාතේ කටුවන ප්‍රාදේශීය සභාවේ කිරම ඉදිකළ බස් නැවතුම්පොළ 2016 මාර්තු සිට නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) මධ්‍යම පළාතේ ලග්ගල - පල්ලේගම සහ රත්තොට සහ සබරගමු පළාතේ අයගම රු.මිලියන 49.45 පිරිවැයකට සම්පූර්ණ කරන ලද සති පොළවල් පොදු ජනතාවගේ භාවිතය සඳහා වර්ෂ 1 ½ තිස්සේ විවෘත කර නොතිබුණි.

(ඉ) ව්‍යාපෘතිය මඟින් ඉදිකරන ලද ගොඩනැඟිලි වල සමහර කොටස් අදාල පළාත් පාලන අධිකාරීන් විසින් අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා නොකරන බව ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය. එම නිසා පොදු ජනතාවගේ ඉල්ලුම අඩුවීම හේතුවෙන් සබරගමු පළාතේ පැල්මඩුල්ල, අයගම, කහවත්ත ප්‍රාදේශීය සභා, ඌව පළාතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව, බස්නාහිර පළාතේ වලල්ලාවිට ප්රාදේශීය සභාව මධ්‍යම පළාතේ රත්තොට ප්‍රදේශීය සභාව, උතුරු මැද පළාතේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව විසින් ඉදිකරන ලද සති පොළවල්වල පවතින වෙළඳ කුටි සහ බහු කාර්යය ගොඩනැඟිලි නිෂ්කාර්යව පැවතුණි. තවද, මධ්‍යම පළාතේ ගලගෙදර, ගඟවට කොරළේ, අඹන්ගඟකොරළේ සහ උඩුදුම්බර ප්‍රාදේශීය සභා, සබරගමු පළාතේ ඉඹුල්පේ, කොළොන්න, කෑගල්ල, රත්නපුර, බලංගොඩ, අයගම සහ ගලිගමුව ප්‍රාදේශීය සභා, බස්නාහිර පළාතේ බියගම, වල්ලාවිට සහ මදුරාවල ප්‍රාදේශීය සභා, ඌව පළාතේ ලුණුගල සහ හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභා සහ වයඹ පළාතේ පලගල, හොරොව්පතාන, නවගත්තේගම, රබාව සහ පොල්පිතිගම ප්‍රාදේශීය සභා විසින් ඉදිකරන ලද බහුකාර්ය ගොඩනැඟිලිවල පවතින දේශන ශාලා දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. අදාල පළාත් පාලන අධිකාරීන් ඔවුන්ගේ සංවර්ධන යෝජනා සකස් කිරීමේදී ප්‍රදේශයේ නියම අවශ්‍යතා හඳුනාගැනීමට පියවර ගෙන නොමැති බව එයින් දැක්විය.

**3.5 මූල්‍ය පාලනය පිළිබඳ ගැටළු**

---------------------------------

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නිරන්තරයෙන් සමාලෝචනයට හැකි වන පරිදි කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2016 ජූනි 10 දිනැති අංක 02/2016 චක්‍රලේඛයේ අවශ්‍යතාවය ප්‍රකාරව, අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීම සඳහා අභ්‍යන්තර විගණකයකු බඳවා ගැනීමට ව්‍යාපෘතිය පියවර ගෙන නොතිබුණි.